# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.31 පැය 1640 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1969/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**01. වෙඩි තැබීමකින් පුද්ගලයන් දෙදෙනෙකු තුවාල ලැබීම - කලවාන පොලිස් වසම.**

2025.10.31 වන අද දින උදෑසන කාලයේ කලවාන පොලිස් වසමේ ගෝනගලකන්ද ප්‍රදේශයේදී යතුරුපැදියකින් ගමන් ගත් පුද්ගලයින් දෙදෙනෙකුට පුද්ගලයෙකු විසින් වෙඩි තැබීමක් හේතුවෙන් දෙදෙනෙකු තුවාල ලබා කලවාන රෝහලට අතුලත් කර ඇති බවට කලවාන පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**තුවාලකරුවන් වයස අවුරුදු 52 ක් හා 38 ක් වන කොස්වත්ත ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

පුද්ගලික ආරවුලක් හේතුවෙන් මෙම වෙඩි තැබීම සිදු කර ඇති බවට පොලිසිය දැනට සිදු කරන ලද විමර්ශනයෙන් අනාවරණය වී ඇති අතර බෝර 12 වර්ගයේ ගිනි අවියකින් මෙම වෙඩි තැබීම සිදු කර ඇති බවට පොලිසිය සැකකරනු ලබයි. සැකකරු හඳුනාගෙන ඇති අතර ඔහු අත්අඩංගුවට ගැනීම සඳහා කලවාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. දුම්රියක ගැටී පුද්ගලයෙකු මියයාම - අම්බලන්ගොඩ පොලිස් වසම.**

2025.10.31 වන අද දින උදෑසන කාලයේ අම්බලන්ගොඩ පොලිස් වසමේ උඩුවරාගොඩ, කහව දුම්රිය හරස් මාර්ගයේදී ත්‍රීරෝද රථයක් බෙලිඅත්ත දෙස සිට මරදාන දෙසට ධාවනය වූ දුම්රියේ ගැටී පුද්ගලයෙකු මිය ගොස් ඇති බවට අම්බලන්ගොඩ පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කරන ලදී.

**මරණකරු වයස අවුරුදු 40 ක් වූ අකුරල, කහව ප්‍රදේශයේ පදිංචි ත්‍රීරෝද රථය පැදවූ රියදුරු වේ.**

මෘත ශරීරය බලපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ත්‍රීරෝද රථයේ රියදුරුගේ නොසැලිකිලිමත් රිය ධාවනය හේතුවෙන් මෙම අනතුර සිදුව ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. අම්බලන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. දුම්රියක ගැටී පුද්ගලයෙකු මිය යාම - කොස්ගොඩ පොලිස් වසම.

2025.10.31 වන අද දින උදෑසන කාලයේ කොස්ගොඩ පොලිස් වසමේ කොස්ගොඩ දුම්රිය ස්ථානය ආසන්නයේ ගාල්ල දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ දුම්රියක ගැටී පුද්ගලයෙකු මියගොස් ඇති බවට කොස්ගොඩ පොලිස් ස්ථානය වෙත ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 70 ක් වූ කොස්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය බලපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කොස්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. මාරක රිය අනතුරක් - ගම්පහ පොලිස් වසම.

2025.10.31 වන අද දින උදෑසන කාලයේ ගම්පහ පොලිස් වසමේ උඩුගම්පොල මාර්ගයේ කෙහෙල්බද්දර හන්දිය ආසන්නයේදී උඩුගම්පොල දෙස සිට කොටුගොඩ දෙසට ධාවනය වූ කාර් රථයක් රියදුරුට රථය පාලනය කර ගැනීමට නොහැකි වී මාර්ගයේ වම් පස සිටි පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා ගම්පහ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 38 ක් වන උඩුගම්පොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ගම්පහ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ගම්පහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**